# සත් දිනක වුවද පැවිද්ද නිවන් දකින තුරු දුගති දොර වසයි

## සත්තාහපබ්බජිත ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 426 - 427)

විපස්සී බුදු රජාණන් වහන්සේගේ භික්ෂූන් වහන්සේලාට සත්කාර හා ගෞරව කළ අයෙක්, නෑදෑයන් අතර ඇති වූ භේදයකින් මිදීමට, කැමැත්තෙන් පැවිදි වී සතියක් වාසය කළා.

ඒ පැවිදි බවේ ආනිසංස ලෙස ඔහු කල්ප අනූ එකක් ඉපදුණේ සුගතියේ ම පමණි. අවසානයේ සක්විති රජ සම්පත් ද විඳ අප බුදු රජාණන් වහන්සේගේ සසුනේ පැවිදි ව රහත් බව ද ලැබූහ.